| | | | |
|---|---|---|---|
| ව්‍යාපාර අධ්‍යනය I<br>Business Studies I | 32 \| S \| I | 13 ශ්‍රේණිය | කාලය : පැය දෙකයි<br>One hours |

විභාග අංකය :

උපදෙස් :-

අංක 01 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නියමිත පිළිතුරු **තෝරා එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**

අංක 31 සිට 50 දක්වා වූ ප්‍රශ්නවලට කෙටි නිශ්චිත පිළිතුරු සපයන්න.

සෑම ප්‍රශ්නයකටම ලකුණු දෙක බැගින් හිමිවේ.

විභාග අංකය හෝ නම ඉහළින් ඇති කොටුවේ පැහැදිලිව සටහන් කරන්න.

| I පත්‍රය සඳහා | |
|---|---|
| ප්‍රශ්න අංකය | ලකුණු |
| 1 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

1) අවශ්‍යතා හා වුවමනා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. ආහාර ඇඳුම් පැළඳුම්, නිවාස, අධ්‍යාපනය, වෛද්‍ය පරීක්ෂණ, ආදිය මූලික මිනිස් අවශ්‍යතා වේ.
2. සමාජ බලවේග මගින් වෙනස් කළ හැකි වීම හා ජීවත් වීම සඳහා අනිවාර්යයෙන්ම සපුරා ගත යුතු වීම අවශ්‍යතා වල ලක්ෂණ වේ.
3. පුද්ගලයාගෙන් පුද්ගලයාට විවිධ වීම, අසීමිත වීම හා ව්‍යාපාරිකයන් විසින් නිර්මාණය කිරීම වුවමනා වල ලක්ෂණ වේ.
4. වුවමනා තෘප්තිමත් කර ගැනීමට පුද්ගලයෙකු යම් නිෂ්පාදිතයක් තෝරා ගැනීම අවශ්‍යතාවය වේ.
5. අවශ්‍යතා ව්‍යාපාරිකයන් විසින් නිර්මාණය කරන අතර වුවමනා නිර්මාණය කළ නොහැකිය. (---------)

2) තොරතුරු තාක්ෂණයේ දියුණුවත් සමග ව්‍යාපාර ක්ෂේත්‍රයේ සිදු වී ඇති ප්‍රවණතාවයක් නොවන්නේ,

1. ගොලීයකරණය ව්‍යාප්ත වීම.
2. විද්‍යුත් ව්‍යාපාර බිහි වීම.
3. පරිසරය පිළිබඳ සැලකිලිමත් වීම.
4. සමාජ වගකීම් පිළිබඳ සැලකිලිමත් වීම.
5. ප්‍රාග්ධන සූක්ෂම කර්මාන්ත බිහි වීම. (---------)

3) පහත සඳහන් සාධක අතුරින් සාර්ව පරිසර බලවේග පමණක් ඇතුළත් වරණය තෝරන්න.

A. සැපයුම්කරුවන් කලට වේලාවට අමුද්‍රව්‍ය සැපයීම
B. රටේ ජනගහනය වර්ධනය වීම
C. නව තරගකරුවන් වෙළඳපොළට පැමිණීම
D. ණය සඳහා පොලිය අඩු වීම.
E. විදේශ රටවල් සමග වෙළඳ ගිවිසුම් ඇති කර ගැනී

1. A , B , D    2 B , C , D    3. A , D , E
4. B , D , E    5. B, C , E    (---------)

4) තිරසර සංවර්ධනය හා සම්බන්ධ ක්‍රියාකාරකම් කිහිපයක් පහත දැක්වේ.

A. සමානාත්මතාවයෙන් යුතුව කටයුතු කිරීම
B. නීතිය හා සාමය සුරැකීමට දායක වීම
C. අධ්‍යාපන, සෞඛ්‍යය , ප්‍රවාහනය ආදී අත්‍යාවශ්‍ය පහසුකම් සඳහා දායක වීම.
D. ආර්ථිකයේ යටිතල පහසුකම් සංවර්ධනයට දායක වීම.
E. මානව අයිතිවාසිකම් සුරැකීමට දායක වීම.
F. ජෛව විවිධත්වය රැකීමට කටයුතු කිරීම.

ව්‍යාපාරයකට සමාජ හා සංස්කෘතික තිරසර බව තහවුරු කිරීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග නම්

1. A , B , D , E    2 B , D , E , F    3. A, C, D ,E
4. B , C , D , E    5. A, B , C , E    (---------)

5) පාරිභෝගිකයා සතු වගකීමක් නොවන්නේ,

1. පරිසරය පිළිබඳ සැළකිලිමත් වීම
2. විචාරාත්මක දැනුවත්භාවය
3. සක්‍රීය සහභාගිත්වය
4. ගුණාත්මක භාණ්ඩ පරිභෝජනය
5. සහයෝගීතාවය    (---------)

6) ව්‍යාපාරවල ලක්ෂණ නිවැරදිව සඳහන් කර ඇති වරණය කුමක් ද?

1. ඇපයෙන් සීමිත සමාගම්වල අවම සාමාජිකයන් ගණන දෙදෙනෙකු වන අතර උපරිමය සීමාවක් නැත.
2. සීමිත පොදු හා පෞද්ගලික සමාගම්වල අවම අධ්‍යක්ෂවරු ගණන දෙදෙනෙකි.
3. සමූපකාරයක් ලියාපදිංචි කිරීමට පුද්ගලයන් අට දෙනෙකු සිටිය යුතුය.
4. සීමිත පොදු සමාගම් කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත වීම අනිවාර්ය වේ.
5. සීමිත පෞද්ගලික සමාගමක අවම කොටස්කරුවන් ගණන 01ක් වන අතර උපරිමය 20 කි.    (---------)

7) රාජ්‍ය අංශයේ ව්‍යාපාරවල දැකිය හැකි ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A- අමාත්‍යාංශයක් යටතේ සෘජු පාලනයට යටත්
B- විශේෂ හෝ පොදු පනතක් යටතේ ආරම්භ කළ යුතුය.
C- වාර්ෂික අයවැය ලේඛනය මගින් මුදල් වෙන් කෙරේ.
D- රජය විසින් පත් කරන අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් පාලනය වේ.
E- ආයතන සංග්‍රහ , මුදල් රෙගුලාසි වලට අනුව කටයුතු කළ යුතුය.
F- නීතිමය පුද්ගලභාවයක් ඇත.

ඉහත ලක්ෂණ අතරින් දෙපාර්තමේන්තුවක ලක්ෂණ ඇතුලත් වරණය තෝරන්න.

1. A , B , C , F    2 B , C , D , F    3. A, B, C ,D
4. A , C , E , F    5. B, D , E , F    (---------)

8) පහත දෑ අතුරෙන් අභ්‍යන්තර ව්‍යවසායකත්ව ලක්ෂණය කුමක් ද?

1. පාරිසරික හා සමාජීය ගැටලු පිළිබඳ සලකා බලමින් පරිසරයට ධනාත්මක බලපෑම් ඇති කරයි.
2. ගෝලීය පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා හා වුවමනා පදනම් කරගෙන නිශ්පාදිත බිහි කිරීමයි.
3. සමාජීය ගැටලු වලට පිළියම් යෙදීමට නවෝත්පාදනයේ යෙදීමයි.
4. සංවිධානවල කටයුතු කරන නිර්මාණශීලී පුද්ගලයන් විසින් නිශ්පාදනයේ නවෝත්පාදන ක්‍රම හඳුන්වා දීමයි.
5. සංවිධානවල තනතුරු සඳහා වඩාත් නිර්මාණශීලී පුද්ගලයන් බඳවා ගැනීමයි.    (---------)

9) ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍යායතන කාර්යයක් නොවන්නේ,

1. රාජ්‍ය ණය කළමනාකරණය
2. මූල්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීම
3. විදේශ විනිමය පාලනය
4. ග්‍රාමීය ණය යෝජනා ක්‍රම පිළිබඳ මූලික ආයතන ලෙස කටයුතු කිරීම.
5. සේවක අර්ථසාධක අරමුදල් කළමනාකරණය කිරීම. (---------)

10) බලපත්‍රලාභී විශේෂිත බැංකුවල කාර්යයක් නොවන්නේ,

1. සමාගම්වල කොටස් ප්‍රාරක්ෂණය කිරීම
2. කල්බදු පහසුකම් සැපයීම
3. ජංගම හා ඉතිරිකිරීමේ ගිණුම් පවත්වාගෙන යාම
4. කළමනාකරණ උපදේශන සේවා සැපයීම
5. විවිධ ක්ෂේත්‍රවල ව්‍යවසායකයින්ට ණය සැපයීම (---------)

11) පහත දැක්වෙන්නේ අවදානම් කිහිපයකි.

A- ණයගැතියෙකුගෙන් ලැබිය යුතු මුදල් නොලැබීමේ අවදානම
B- මෝස්තර වෙනස් වීම නිසා ඇති වන අවදානම්
C- ව්‍යාපාරය පාඩු ලැබීම්
D- යන්ත්‍ර ක්ෂය වීම නිසා ඇතිවන අවදානම්
E- මාර්ගස්ථ මුදල්වලට සිදුවන හානි

ඉහත දැක්වෙන අවදානම් අතරින් රක්ෂණ ය කළ නොහැකි අවදානම් වනුයේ,

1. A , B , D    2 B , C , D    3. A , D , E
4. C , D , E    5. A, B , C (---------)

12) මුහුදු උවදුරු රක්ෂණය යටතේ ලබා ගන්නා නැව් කඳ රක්ෂණ ඔප්පුවක් නොවන්නේ,

1. සියලු අවදානම් ඔප්පුව
2. තොටුපොළ ඔප්පුව
3. ඇගයූ ඔප්පුව
4. පූර්ණ අලාභය පමණක් ගෙවන ඔප්පුව
5. අලුත්වැඩියා ඔප්පුව (---------)

13) පහත දැක්වෙන සන්නිවේදන ක්‍රම අතරින් අභ්‍යන්තර සන්නිවේදන ක්‍රම පමණක් ඇතුලත් කාණ්ඩය තෝරන්න.

1. ඉන්ටර් කොම්. ශබ්දවාහිනී යන්ත්‍ර, සීනුව , මඟ සලකුණු
2. දැන්වීම් පුවරුව , මෙමෝ පත්‍ර , දුරකථන , විදුලි සංඥා
3. සම්මුඛ සාකච්ඡා , දැන්වීම් පුවරු , බැනර් , විද්‍යුත් තැපෑල
4. ගැසට් පත්‍ර , ඉන්ටර් කොම් , ජංගම දුරකථන , සම්මුඛ සාකච්ඡා
5. මෙමෝ පත්‍ර , ඉන්ටර්කොම් , දැන්වීම් පුවරුව , මඟ සලකුණු (---------)

14) ජාත්‍යන්තර වෙළඳාමේ දී භාවිතා කරනු ලබන ලේඛන වර්ග සහ ඒවා සම්බන්ධ විස්තර කිහිපයක් පහත දැක්වේ.

| ලේඛනය | විස්තරය |
|---|---|
| i. සනීපාරක්ෂක සහතිකය | A- භාණ්ඩ නැවට භාරගත් බවට පිළිගැනීම |
| ii. වාප්පුකාර කුවිතාන්සිය | B- උපනයන භාණ්ඩ නිෂ්පාදනය කළ රටෙහි නම සහතික කිරීම. |
| iii. ප්‍රභවස්ථාන සහතිකය | C- කෘෂි නිෂ්පාදිතවල පරිභෝජන යෝග්‍යතාව තහවුරු කරමින් ලබාදෙන සහතිකයයි. |
| iv. නෞභාරපත | D- රේගුවට භාණ්ඩ භාරගත් බව සඳහන් කරමින් අපනයනකරුට නිකුත් කරන ලියවිල්ලයි. |

ඉහත දී අති ලේඛන වර්ග අනුපිළිවෙළ අනුව අදාළ විස්තර නිවැරදිව ගලපා ඇති වරණය කුමක් ද?

1. B , C , D , A    2. D , C , B , A    3. C, B , D , A
4. C , A , B , D    5. C, D , B , A    (---------)

15) ප්‍රධානියා වෙනුවෙන් ණයට භාණ්ඩ විකිණීම සිදු කර එම ණය මුදල ආපසු එකතු කර දීම සඳහා වගකීම භාරගනු ලබන්නේ,

1. කැපකරු නියෝජකතයා ය    2. සාධ්‍යකයා ය    3. වෙන්දේසිකරු ය
4. කොමිස් නියෝජිතයා ය    5. තැරැව්කරු ය    (---------)

16) ව්‍යාපාර අරමුණක තිබිය යුතු ගුණාංගයක් නොවන්නේ,

1. නිශ්චිතවීම    2. ළඟා කරගත හැකි බව    3. මැනිය හැකි බව
4. යථාර්ථවාදී බව    5. කෙටි කාලීන බව    (---------)

17) පහත දැක්වෙන්නේ ව්‍යාපාර සංවිධානයක් තුළ ක්‍රියාත්මක කරනු ලබන අභිප්‍රේරණ ක්‍රම කිහිපයකි.

A- උසස්වීම් ලබා දීම
B- ප්‍රසාද දීමනා ලබා දීම
C- ආයතනයේ නිෂ්පාදිත සහන මිට ලබා දීම
D- රැකියා සුරක්ෂිත බව ඇති කිරීම
E- ණය පහසුකම් ලබා දීම
F- කොටස් හිමිකාරිත්වය ලබා දීම.

මෙම අභිප්‍රේරණ ක්‍රම අතුරින් මූල්‍යමය අභිප්‍රේරණ ක්‍රම ඇතුලත් වරණය තෝරන්න.

1. B , C , E , F    2. A , B , C , E    3. B, C , D , E
4. A , B , C , D    5. A, B , E , F    (---------)

18) නිෂ්පාදන ක්‍රියාවලියේ දී එක සමාන හා විෂම යන්ත්‍ර වෙන වෙනම කුටි වල සවි කර නිෂ්පාදනය සිදු කිරීම හඳුන්වන්නේ,

1. ක්‍රියාවලි පිරියත    2. කුටි පිරියත
3. ස්ථාවර ස්ථානීය පිරියත    4. නිෂ්පාදන පිරියත
5. කාර්ය බද්ධ පිරියත    (---------)

19) නිෂ්පාදිතයේ ගුණත්වය තහවුරු කර ගැනීම සඳහා නිෂ්පාදන ක්‍රියාවලියේ සෑම අදියරක් ම විධිමත් පරීක්ෂාවකින් යුතුව සිදු කිරීම හඳුන්වන්නේ,

1. තත්ත්ව කව    2. ගුණත්ව ප්‍රමිති
3. ශූන්‍ය දෝෂ    4. තත්ත්ව ආරක්ෂණය
5. සංඛ්‍යාත්මය ක්‍රියාවලි පාලනය    (---------)

20) සඵලදායී බණ්ඩනයක් සඳහා පැවතිය යුතු ගුණාංග පමණක් ඇතුලත් වරණය තෝරන්න.

1. මැනිය හැකි වීම, ලගාවිය හැකි බව , ප්‍රමාණවත් බව , ක්‍රියාත්මක කළ හැකි බව
2. වෙන්කොට හඳුනාගත හැකි බව , මැනිය හැකි බව , ලගාවිය හැකි බව , නිශ්චිත වීම
3. නිශ්චිත වීම, මැනිය හැකි වීම, ප්‍රමාණවත් බව , ක්‍රියාත්මක කළ හැකි බව
4. මැනිය හැකි බව , යථාර්ථවාදී බව , ප්‍රමාණවත් බව , නිශ්චිත වීම
5. ප්‍රමාණවත් බව , මැනිය හැකි බව, නිශ්චිත බව, යථාර්ථවාදී බව (---------)

21) අලෙවිකරණ දර්ශකය තුළ ඇතුලත් අලෙවිකරණ සංකල්පය මගින් අදහස් වනුයේ,

1. ඉහළ ගුණත්වයකින් හා ක්‍රියාකාරිත්වයකින් යුක්ත නිෂ්පාදන මිල දීගැනීමට පාරිභෝගිකයා පෙළඹවීම.
2. තරගකාරී විකුණුම් ප්‍රතිපත්ති හා විකුණුම් ප්‍රවර්ධන ක්‍රම අනුගමනය කරමින් නිෂ්පාදිත අලෙවි කිරීම.
3. ඉලක්ක වෙළඳපොලේ අවශ්‍යතා හා වුවමනා හඳුනාගෙන ඊට අනුකූලව භාණ්ඩ හා නිෂ්පාදනය මගින් පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීමයි.
4. සමාජීය යහපැවැත්ම ආරක්ෂාවන ආකාරයට වෙළඳපොලේ අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීමයි.
5. ගනුදෙනුකරුවන් වෙන් වෙන්ව ගෙන ඒ ඒ ගනුදෙනුකරුට ගැළපෙන පරිදි නිෂ්පාදිත ඉදිරිපත් කිරීමයි.

(---------)

22) යම් නිෂ්පාදන ආයතනයක් එකම සන්නමක් යටතේ භාණ්ඩ පෙළක් ඉදිරිපත් කිරීම හඳුන්වන්නේ,

1. ජාතික සන්නම
2. භාණ්ඩ සන්නම
3. පවුල් සන්න්ම
4. පෞද්ගලික සන්නම
5. කාණ්ඩ සන්නම (---------)

23) මූල්‍ය කළමනාකරණයේ මූලික අරමුණ වන්නේ,

1. ලාභය උපරිම කිරීමයි.
2. කොටසක ඉපයුම උපරිම කිරීමයි.
3. දිගුකාලීන මූල්‍ය ස්ථාවරත්වය තහවුරු කිරීමයි.
4. හිමිකරුවන්ගේ ව්‍යාපාරය හා සබැඳි අගය උපරිම කිරීමයි.
5. ද්‍රවශීලතාවය ප්‍රශස්ථ මට්ටමක පවත්වා ගැනීමයි. (---------)

24) කොටස් වෙළඳපොලේ සමාගම් ලැයිස්තුත කිරීමේ දී සපුරාලිය යුතු අවශ්‍යතා කිහිපයක් පහත දැක්වේ.

A- ලැයිස්තුගත වීමට ඉල්ලුම් කරන දිනට පෙර අඛණ්ඩව වසර 03ක් බදු පෙර ශුද්ධ ලාභ ලබා තිබීම.
B- නිකුත් කර ඇති කොටස් ප්‍රමාණයෙන් අවම වශයෙන් 10% ක් මහජනයා සතු වීම.
C- සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් මිලියන 500ට නොඅඩු වීම.
D- ව්‍යාපාපරයේ ශුද්ධ වත්කම් ආසන්න වසර දෙකක විගණනය කරන ලද මූල්‍ය වාර්තා මගින් තහවුරු වීම
E- සමාගමේ ක්‍රියාකාරී කාලය අවම වශයෙන් වසරක් වීම.

ප්‍රධාන පුවරුවේ ලැයිස්තු ගතවීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම් වනුයේ,

1. A , B , C
2 A , B , D
3. A , C , E
4. A , C , D
5. B, C , E (---------)

25) කොටස් වෙළඳපොලේ ආයෝජනයෙන් ලැබෙන ඍජු ප්‍රතිලාභයක් නොවන්නේ,

1. ඡන්ද බලය හිමි වීම
2. ලාභාංශ
3. සංචිත ප්‍රාග්ධනීකරණය
4. හිමිකම් නිකුතුව
5. ප්‍රාග්ධන ලාභ (---------)

26) අභ්‍යන්තර සේවක ආකර්ශණ ක්‍රමයක් නොවන්නේ,

1. කුසලතා ඉන්වෙන්ට්‍රි
2. අභ්‍යන්තර සේවකයන්
3. අන්ප්‍රාප්ති සැලැස්ම
4. අභ්‍යන්තර ජාලය
5. අතීත සේවකයින් මගින් (---------)

27) විනය කළමණාකරණයේ වැදගත්කම නිවැරදිව සඳහන් කර ඇති ප්‍රකාශය තෝරන්න.

1. සේවකයින් අතර මතභේද අවම කිරීම.
2. සේවකයින්ගේ ස්වයං විශ්වාසය වර්ධනය කිරීම.
3. සේවකයින් වෙත තීරණ දැනුම් දීම
4. සේවක රැකියා සුරක්ෂිතතාවය තහවුරු කිරීම.
5. වෛද්‍ය රක්ෂණ වියදම් අඩු කර ගැනීම. (---------)

28) දත්ත සැකසුම් ක්‍රියාවලියට අයත් කාර්යයක් නොවන්නේ,

1. වර්ගීකරණය කිරීම
2. ගණනය කිරීම
3. තේරීම
4. බෙදා වෙන් කිරීම
5. සාරාංශකරණය (---------)

29) පහත වගුවෙහි දැක්වෙන්නේ තොරතුරු පද්ධති භාවිතා කරන මට්ටම් හා තොරතුරු පද්ධති වර්ග කිහිපයකි.

| භාවිතා කරන මට්ටම | තොරතුරු පද්ධති වර්ග |
|---|---|
| i. උපක්‍රමික මට්ටම | A-ගනුදෙනු සැකසුම් පද්ධති |
| ii. කළමනාකරණ මට්ටම | B-කාර්යාල ස්වයංකරණ පද්ධති |
| iii. දැනුම් මට්ටම | C-විධායක උපකාරක පද්ධති |
| iv. මෙහෙයුම් මට්ටම | D-තීරණ උපකාරක පද්ධති |

ඉහත තොරතුරු නිවැරදිව ගලපා ඇති වරණය කුමක් ද?

1. D , C , B , A
2. D , C , A , B
3. C, D , A , B
4. C , D , B , A
5. B , C , D , A (---------)

30) ව්‍යාපාරය විසින් සපයන භාණ්ඩය හෝ සේවාව පිළිබඳවත් එමගින් ගනුදෙනුකරුවන්ට ලැබෙන ප්‍රතිලාභයන් ඇතුලත් කර සකස් කරනු ලබන්නේ,

1. විධායක අංශයයි
2. ව්‍යාපාර විස්තරයයි
3. මෙහෙයුම් සැලැස්මයි
4. අලෙවි සැලැස්මයි
5. ව්‍යාපෘති සාරාංශයයි (---------)

**31 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

31) (අ) ඕනෑම ව්‍යාපාරක සිදු වන ප්‍රධාන කටයුතු දෙක වනුයේ -------------------------------------- හා -------------------------------------------- වේ.

(ආ) අප ද්‍රව්‍ය කළමනාකරණයේ දී ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ආකාර දෙක වන්නේ------------------------------ -------------------- හා ------------------------------------------------------------ ය.

32) (අ) රජයේ පිස්කල් ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණ වන්නේ ------------------------------------------------ ය.

(ආ) ආර්ථික ස්ථායීතාවය කොටස් දෙක නම් ---------------------------------------------------------- හා -------------------------------------------------- වේ.

33) (අ) වරලත් හිමියාගේ වෙළඳ ලකුණ යටතේ භාණ්ඩ නිෂ්පාදනය කර බෙදා හැරීම ---------------------------- ------------------------ වන අතර වරලත් හිමියාගේ නමින් හා ක්‍රමය යටතේ පවත්වාගෙන යාමට අයිතිය පැවරෙන ව්‍යාපාර ------------------------------------------------------- ලෙස හැඳින්වේ.

(ආ) වරලත් ලාභියා විසින් දළ ------------------------------------------------- වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස වරලත් හිමියා වෙත ගෙවිය යුතු වන්නේ ------------------------------------------------ වේ.

34) (අ) තිරසර සංවර්ධනය සඳහා දුප්පත්කම තුරන් කිරීම-------------------------------------------------- ප්‍රධාන ඉලක්කය වේ.

(ආ) ඇමෙරිකා එක්සත් ජනපදය , කැනඩාව හා මෙක්සිකෝව යන රටවල් සම්බන්ධ වී ------------------------ ----------------------------------- වෙළඳ ගිවිසුම ක්‍රියාත්මක කරයි.

35) (අ) වාණිජ බැංකු අතර කෙටි කාලීන ණය ඉල්ලුම් සහ ණය පහසුකම් සිදුවන වෙළඳපල ---------------------- ------------------------------------------ වේ.

(ආ) නිෂ්පාදික මිලදී ගැනීම සඳහා ඉක්මනින් පොළඹවන කෙටිකාලීන දිරිගැන්වීම් උපක්‍රම ------------------- --------------------------------------------------- වේ.

36) (අ) ආර්ථික ඇණවුම් ප්‍රමාණයේ දී --------------------------------------------------------------------------- හා ------------------------------------------------------- එකිනෙකට සමාන වේ.

(ආ) ආයතනයක සේවකයින් බඳවා ගැනීමේ පදනම් වනුයේ ------------------------------------පදනමයි.

37) (අ) නිෂ්පාදිතයා විසින් නිෂ්පාදිත වෙළෙඳුන්ට අලෙවි කළ පසුව එම නිෂ්පාදිත සඳහා නිර්මාණය කර ගන්නා සන්නම -------------------------------------------------------------- ලෙස හැඳින්වේ.

(ආ) ව්‍යාපාරයක මූල්‍ය වාර්තා විශ්ලේෂණය කිරීමෙන් සිදු කරනු ලබන ඇගයීම -------------------------------- ---------------------------------- ලෙස හැඳින් වේ.

38) (අ) සමාගම් තම කෙටිකාලීන ද්‍රවශීලතාව අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ---------------------------------- නිකුත් කරයි.

(ආ) රාජ්‍ය සංස්ථා හා පොදු සමාගම් විසින් මධ්‍ය හා දිගුකාලීන අරමුදල් සපයා ගැනීම සඳහා ------------ ---------------------------------- නිකුත් කරයි.

39) (අ) යම් කාලයක් තුල සේවකයින් ආයතනයෙන් ඉවත්ව යාමේ සීඝ්‍රතාව ------------------------------- ලෙස හඳුන්වන අතර සේවකයන් සේවයට පැමිණ සේවය නොසැපයීම ------------------------------------- ලෙස හැඳින් වේ.

40) (අ) සංවිධානයක සිදුවන නොයෙකුත් සිදුවීම් මගින් ජනිත වන මූලික කරුණු ----------------------------- වන අතර ප්‍රයෝජනයට ගත හැකි ලෙස සකස් කළ පසු ------------------------------------------ ලැබේ.

(ආ) නවක සේවකයන් සමාජ ගත කිරීමේ ක්‍රියාවලිය ------------------------------------------------ වන අතර ඔවුන්ගේ සේවාව ස්ථිර කිරීම දක්වා කාලය ---------------------------------------- ලෙස හැඳින් වේ.

**අංක 41 සිට 50 තෙක් ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු සපයන්න.**

41) සමාගමක් ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු ලියවිලි හතරක් සඳහන් කරන්න.

1. ------------------------------------------------------------------------
2. ------------------------------------------------------------------------
3. ------------------------------------------------------------------------
4. ------------------------------------------------------------------------

42) බලය ලැබෙන මූලාශ්‍ර හතරක් සඳහන් කරන්න.

1. ------------------------------------------------------------------------
2. ------------------------------------------------------------------------
3. ------------------------------------------------------------------------
4. -----------------------------------------------------------------------

43) බලතල මධ්‍යගත කිරීම මගින් සංවිධානයකට ලබා ගත හැකි වාසි හතරක් සඳහන් කරන්න.

1. ---------------------------------------------------------------------
2. ---------------------------------------------------------------------
3. ---------------------------------------------------------------------
4. ---------------------------------------------------------------------

44) අයදුම්කරුවන් තෝරාගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු වන්නේ,

1. ---------------------------------------------------------------------
2. ---------------------------------------------------------------------
3. ---------------------------------------------------------------------
4. ---------------------------------------------------------------------

45) ආයතනයක සේවක ප්‍රවාසිතාවය සිදුවන ආකාර හතරක් ලියන්න.

1. ---------------------------------------------------------------------
2. ---------------------------------------------------------------------
3. ---------------------------------------------------------------------
4. ---------------------------------------------------------------------

46) රටක මූල්‍ය ක්‍රමයේ සංවිධිත ක්‍රියාකාරිත්වය හා ස්ථායීතාව තහවුරු කිරීම සඳහා භාවිතා කරන මූල්‍ය යටිතල පහසුකම් වර්ග හතරක් සඳහන් කරන්න

1. ---------------------------------------------------------------------
2. ---------------------------------------------------------------------
3. ---------------------------------------------------------------------
4. --------------------------------------------------------------------

47) පළාත් පාලන ආයතන යටතේ පවතින ව්‍යාපාරවල ලක්ෂණ හතරක් සඳහන් කරන්න.

1. ---------------------------------------------------------------------
2. ---------------------------------------------------------------------
3. ---------------------------------------------------------------------
4. ---------------------------------------------------------------------

48) විදේශ වෙළඳාමට එරෙහි වන විවිධ බාධා අවම කර ගැනීම සඳහා පිහිටුවා ඇති ජාත්‍යන්තර සංවිධාන හතරක් නම් කරන්න.

1. ---------------------------------------------------------------------
2. ---------------------------------------------------------------------
3. ---------------------------------------------------------------------
4. ---------------------------------------------------------------------

49) දත්ත සැකසීම් තාක්ෂණය වර්ග 04 (හතරක්) දක්වන්න.

1. ---------------------------------------------------------------------
2. ---------------------------------------------------------------------
3. ---------------------------------------------------------------------
4. ---------------------------------------------------------------------

50) ව්‍යාපාර සැළැස්මක් සැකසීමේ දී ව්‍යාපාර සැලැස්ම පුරාම අවධානය යොමු කළ යුතු කරුණු 04 (හතරක්) නම් කරන්න.

1. ---------------------------------------------------------------------
2. ---------------------------------------------------------------------
3. ---------------------------------------------------------------------
4. ---------------------------------------------------------------------